# හද රිදවන මතක සුවඳ



15

ඉස්කෝලේ හාමිනේට කඩුවකින් පහර දී තිබුණේ ඇය පුත් තනතුරේ තබාගෙන හදාවඩාගත් දුර්ජනයෙක් විසින් දේපළ ප්‍රශ්නයක් සම්බන්ධයෙනියි මා වටහා ගත්තේ, එවෙලෙහි එහි රොක්ව සිටි ජනතාවගේ කථා බහිනි. ගුරුතුමිය මරණින් බේරී සුවපත් වූයේ දෙඅතේම ඇඟිලි අක්‍රිය වූ අංග විකල තත්වයෙනි.

අම්මා කියා මිස ටීචර් කියා කිසිම දිනක මවිසින් අමතන නොලද්දා වූ ඇයත්, ඇයගේ ස්වාමි පුරුෂයා වූ තාත්තාත් මා හඳුනා ගත්තේ ද, ඔවුන්ට සමීප වූයේද ඔවුන්ගේ පුත්‍ර 'බැනර්ජි' සහෝදරයා පක්ෂයට සම්බන්ධ වූ පසුවය.

අම්මාත් තාත්තාත් ජීවත් වූ නිවස පිහිටි මහාද්වීපය යූ.ඇන්.පී. කාරයන්ගේ බලකොටුවකි. අතරින් පතර ශ්‍රී ලංකා කාරයෝ දෙතුන් දෙනෙකු හිටියත් ජේ.වී.පී. කාරයෝ නම් හිටියේම නැති තරම්ය. එබැවින් මේ වයස අවරුදු හැට ගණන්, හැත්තෑ ගණන්වල සිටින අම්මාත් තාත්තාත් ජ.වි.පෙ.ට වහ වැටී එහි ජයග්‍රහණය වෙනුවෙන් කැපවීම යූ.අන්.පී. බලකොටුවේ උන් සෙසු වැඩිහිටියන් ද අලුත්ම අලුත් ජීවිත පාඩමක් කියා දෙන්නාක් වැනිවිය. පක්ෂයට ද එම නිවස මුලකඳවුරක් තරම් වටිනා ස්ථානයක් විය.

"මොකෝ පුතේ දවස් දෙක තුනකින් ඒ පැත්තෙ නාවේ ?"

දින කිහිපයක් ඇය දකින්නට යන්නට නොහැකි වුවහොත් අම්මා මා බලන්නට එයි. අපේ නිවස පසුකර නාන්නට යන ගමනේදීත් මා ගෙදර සිටීනම් දැක කථාබස් කර යයි.

"තාත්තාටත් ආදායමක් නැති එකේ මගේ පැන්ෂන් එකෙන් විතරක් ජීවත් වෙන්න හරි අමාරුයි, පුතේ. අපේ බැනර්ජි රස්සවකට යැව්ව නම් අපිට මේ හැටි අමාරුවක් නෑ. ඒත් හැමෝම රස්සාවල් වලට ගිහිල්ලා පවුල් පන්සල් වෙලා පැත්තකට උනාම මේ වැඩේ කරන්නෙ කව්ද ?" සිය එකම පුතණුවන් පක්ෂයට පරිත්‍යාග කිරීම ගැන ඇය දරූ මතය එබඳු විය.

1982 දී පක්ෂය විසින් පැවත් වූ දැවැන්ත මැයි පෙළපාලියට සහභා-ගිවීමට අම්මා දැඩි අදිටනකින් පසුවූවත් ඇවිදීමටත් අපහසු ඇයට එවන් වෙහෙසකර ගමනක් පීඩාකාරී වේයැයි සිතූ අප අම්මා වළක්වන්නට කරුණු කීමු.

"නෑ. නෑ. මං එනවාමයි. මට දූගේ අත අල්ලගෙන හරි ඇවිදින්න බැරියැ. ?" මැයි පෙළපාලියේදී සිය දියණියගේ අතේ එල්ලී අම්මා එම මුළු දුරට ගෙවා නගරසභා පිටියට ගියේ නිකම්ම නොවේ. අත් ඉහළට ඔසවමින් සටන් පාඨ ද කියමිනි.

නිතරම ධෛරයවත් ස්වභාවයක් පෙන්නුම් කළ අම්මා තරමක කනගාටුවෙන් කල් ගතකලේ සිය පුත් බැනර්ජී, කුමානායක හා ප්‍රේමකුමාර යන සහෝදරවරුන් දෙදෙනා සමඟ රාජ්‍ය විරෝධී පෝසටර් ගැසීමේ චෝදනාව යටතේ මාසයක් පමණ රිමාන්ඩ් බන්ධනාගාරයේ ගතකළ කල්හිය. එකල්හිද ඇය සතියකට දින තුනක්වත් මාතර හිරගෙදරට ගියේ තුන්දෙනාටම බත්මුල් තුනක් ද බැඳ ගෙනය.

> **"අපේ පුතාලාට ගම්වල මිනිස්සු අතරට ගිහිල්ලා අපේ මතවාදය හොඳට එස්ටැබ්ලිෂ් (ස්ථාපිත) කරන්න පුළුවන් උනාට ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතිය අතරට ගියාම උන් කඩුව දැම්මොත් (ඉංග්‍රීසියෙන් කථා කළොත්) උන්ගෙ තර්ක පරද්දන්න හැකි දැනුම තිබුණත් ඉංග්‍රීසියෙන් ඒක කියන්න බැරිකම නිසා පැරදිලා එන්න සිද්ධ වෙනවා. මේ අධ්‍යාපන පන්ති කරනවා වගේ අපේ පුතාලට දූලට ඉංග්‍රීසි පන්ති පවත්වන්න පුළුවන් නම් හරි වටිනවා.**

හතර රියන් පුරුෂයෙකු වන, උසේ තරමට මහත, හැඩිදැඩි තාත්තා මහකළු සිංහලයෙකු වැනිය. වයස අවුරුදු හැත්තෑවකට අඩුවූයේ තව වසර දෙක තුනක් වුවත් තාත්තාගේ විශේෂය වූයේ තරුණයෙකුගේ මෙන් පැත්තට පීරා තිබූ කොණ්ඩය සුදුම සුදු පැහැවීමත් තට්ටය නොපෑදී තිබීමත් විය. දසන් දෙපළද වැඩි අඩු පාඩුවකින් තොරව සුරැකී තිබුණි. එබැවින් තාත්තා වෙතින් පළවූයේ වයසට නොපෑහෙන තරුණ පෙනුමකි.

පෙරදී, මාතර නූපෙ හන්දියේ පවත්වාගෙන ගිය ගොඩනැගිලි ද්‍රව්‍ය ව්‍යාපාරයක හිමිකරුව සිටි තාත්තා වෙළඳාම් බංකොලොත් වී ව්‍යාපාර අත්හැර දමා සිටියෙන් තරමක නිදහස් ජීවිතයක් ගත කලත් එම ජීවිතය ඔහුට ඒකාකාරී හා අලස ජීවන රටාවක් සේ දැනෙන්නට ඇත. පක්ෂයට සම්බන්ධ වූ තැනේ පටන් තරුණයෙකු මෙන් කඩිසරවත් මහා උනන්දුවකිනුත් වැඩ කරන්නට පටන්ගත් තාත්තා ටික කලකින්ම මාතර දිස්ත්‍රික්කය පුරාම උන් පක්ෂයේ සහෝදර සහෝදරියන් අතර ජනප්‍රිය චරිතයක් බවට පත්විය.

තාත්තා වෙනත් ආසනවල වැඩ කටයුතුවලට ආනාරාධනයයෙන් වුවද ගොස් සහභාගි විය. නෑ ගමන් යන්නාක් මෙන් පක්ෂ සහෝදර සහෝදරියන්-ගේ, හිතවතුන්ගේ ගෙවල්වලට ගොඩ වී දුක සැප විමසා බැලුවේ ය. නිතර මාතර උසාවිය පැත්තේ ගොස් පක්ෂයේ සහෝදරවරු දේශපාලන නඩුවලට පැමිණ සිටීනම් ඒවා ගැන සොයා බැලුවේ ය. රිමාන්ඩ් බන්ධනාගාර ගතවී ඇති සහෝදරවරු සිටීනම් ඔවුන් බැලීමට හිර ගෙදරට ගියේ ය. විජේවීර සහෝදරයාට මහත් ආදරයක් දැක්වූ තාත්තා හිටි ගමන් ඔහු බැලීමට මොරටුවේ නිවසට ද ගියේ ය. තාත්තා මාතර උසාවිය අසල කොතරම් ජනප්‍රිය පුද්ගලයෙකු වීද යත්, රෝහණ විජේවීර සහෝදරයාගේ පියතුමන් ඔහු පාසල් සිසුවකුව සිටි කාලයේම මියගිය බව නොදත් සමහරු "අර ඉන්නේ රෝහණ විජේවීරගේ තාත්තා" යයි මේ තාත්තා කිසිවකුට පෙන්වා පැවසූ වාර ද විය.

'විමුක්ති ගී' ප්‍රසංගය වැලිගම සේනානායක පිටියේදී පැවැත්වීමට කටයුතු සූදානම් කළ අප වර්ණවත් හා ආකර්ෂණීය පෝස්ටර්වලින් හා වෙනත් ප්‍රචාරණ උපක්‍රමවලින් විශාල ප්‍රචාරයක් ලබා දුනිමු. එහි එක් අංගයක් වූයේ විශාල දැන්වීම් පුවරුවක් බැගින් පිටේ බැඳගත් කණ්ඩායමක් බයිසිකල් පෙළපාළියකින් නගර ගම් දනව් පුරා සංචාරය කිරීමයි. මෙම බයිසිකල් පෙළපාළියේ නායකත්වය සිය කැමැත්තෙන්ම භාරගත්තේ තාත්තා ය. තමාගේ පුතුන් හෝ මුනුබුරන් මෙන් වූ තරුණයන් පිරිසක් පිරිවරාගත් තාත්තා රතු කැප් තොප්පියක් පැළඳ මහා දැන්වීම් ලෑල්ලක් පිටේ බැඳගෙන මුළු දවසක් පුරාම නගරයේ මහමාවත්වලත් ගම් ඇතුළතත් කරක් ගැසුවේ සියලු දෙනාගේම විශේෂ අවධානය ඔහු වෙත යොමු වී තිබියදී ය.

කිසිවෙකුට, කිසිවකට බය නැති තාත්තා කිවයුතු දෙයක් ඕනෑම කෙනෙකුගෙ ' මුහුණටම කිව්වේ විවෘතවම ය. විහිළුවට තහළුවට ලැදි තාත්තා තරමක කනස්සලු ස්වභාවයකින් පසුවූයේ නම් යම්කිසි පීඩාකාරී අසනීපයක් උත්සන්න වූ කල්හි පමණ ය.

"පුතා, අද මම ටවුන් එක මැදින් යනකොට මේ අඳුරන යූ.ඇන්.පී. එකෙක් මට කිව්ව, "අන්න ඔහෙලයි ගේ ළඟ කාරෙකක් නතර කරලා රෝහණ විජේවීර ගෙදරට යනවා මම දැක්කා" යි කියලා. මූ කාටත් ඇහෙන්න මට එහෙම කිව්වේ නිකං සවුත්තුවට වගේ. මමත් බයිසිකලේ නවත්තලා කිව්වා, "ඔව් ඔව් විජේවීර අපේ ගෙදර ඉඳලා යන ගමන් රේන්ද පැලටත් (මාළු වෙන්දේසිපළ) ගිහිල්ලා හොඳ බලයො දෙන්නෙකුත් අරගෙන උඹලගේ අම්මා බලන්නත් යනවාය කිව්වායි කියලා" උගේ කට එහෙමම වැහුණා.

එක් දිනක මා හමුවන්නට පැමිණි තාත්තා එසේ කියා හක හක ගා සිනාසුණේ ය. ඕනම දෙයක් විවෘතව කතා බහ කිරීමේ පුරුද්දක් ඇති තාත්තා අපගේ සහෝදරවරුන් පිරිසකට අර්ශස් රෝග ය ගැන පැහැදිලි කිරීමක් කරන ලද්දේ මෙසේය.

"පුතා, අර්ශස් රෝගියෙකුට තියන අමාරුම දේ තමයි මළපහ කිරීම, නිරෝගී කෙනෙකුට යන්න ඕන බෙට්ට හරියට පිට්ටු බම්බුවෙන් පිට්ටුව එළියට එනවා වගේ තනි බෙට්ටක්. අර්ශස් හැදුනම එහෙම නෑ නිකම් කරුංක පුරුක් වගේ පොඩි පොඩි ගුළි ගුළි තමයි යන්නේ. මම මේ දැනුත් ඉන්නේ අමුඩයක් ගහගෙන. නැත්තම් සරම ඉවරයි."

අර්ශස් පාඩමට අපේ සහෝදරවරු සිනහ වූයේ බඩවල් අල්ලාගෙනය. තාත්තා ඉංග්‍රීසි උගතෙකි. ඔහු චතුර ලෙස ඉංග්‍රීසියෙන් කථා කළේ ය. අපගේ සහෝදරවරු අතලොස්සකට හැරෙන්නට අන් අයට ඉංග්‍රීසියෙන් කථා කිරීමට ඇති නොහැකියාව ගැන තාත්තා මා සමඟ ඉංග්‍රීසියෙන් කථා කළේ ද කනස්සලු සිතිනි.

"අපේ පුතාලාට ගම්වල මිනිස්සු අතරට ගිහිල්ලා අපේ මතවාදය හොඳට එස්ටැබ්ලිෂ් (ස්ථාපිත) කරන්න පුළුවන් උනාට ඉංග්‍රීසි උගත් මධ්‍යම පංතිය අතරට ගියාම උන් කඩුව දැම්මොත් (ඉංග්‍රීසියෙන් කථා කළොත්) උන්ගෙ තර්ක පරද්දන්න හැකි දැනුම තිබුණත් ඉංග්‍රීසියෙන් ඒක කියන්න බැරිකම නිසා පැරදිලා එන්න සිද්ධ වෙනවා. මේ අධ්‍යාපන පන්ති කරනවා වගේ අපේ පුතාලට දූලට ඉංග්‍රීසි පන්ති පවත්වන්න පුළුවන් නම් හරි වටිනවා.

තාත්තා යෝජනා කළේ වරක් දෙවරක් නොවේ.

යම් යම් සුළු පරිමාණයේ කර්මාන්ත ගෘහස්තව කිරීම සඳහා උපදෙස් ඇතුළත් ඉංග්‍රීසි පොතක් තාත්තා සතුව තිබිණ. ඔහු මේ පොතෙන් ලබා ගන්නා උපදෙස් අනුව ඇතැම් දේ නිපදවීමට උත්සහ ගත්තේ ය. තමා දන්තාලේපයක් හැදීමට උත්සහ කරන බවත් දැන් ලේපය හදාගෙන ඇති නමුත් දත් මදින විට පෙණ නගින ක්‍රමය සොයා ගැනීමට තවමත් නොහැකි වූ බවත් තාත්තා මා සමඟ පැවසුවේ යම් කනස්සලු ස්වරයකිනි.

බොහෝ දිනවල සවස් වරුවේ මා දැකීමට අප නිවසට පැමිණ පැයක් හමාරක් කථා බහ කරමින් සිට යන තාත්තා එක් දිනක් මා සොයා පැමිණියේ උද්‍යසන හතවීමටත් ප්‍රථමයෙනි. උදා ළහිරු රැස් පින්නෙන් තෙත්ව තිබූ ගහකොළ මහත්, රැය පුරා සිසිල්ව තිබූ ගාලුපාරේ තාර අතුරනය මතත් පැතිරෙමින් තිබූ එම මොහොතේ මම කොහේදෝ යන්නට ලක ලෑස්ති වෙමින් සිටියෙමි.

"යුරේකා ! යුරේකා !! මං හොයා ගත්තා. මං හොයා ගත්තා." මහත් උද්දාමයකින් එසේ කියමින් තාත්තා ගෙට ගොඩවූයේ සාපේක්ෂතාවාදය සොයා ගත් මහා විද්‍යඥ ඇල්බට් අයින්ස්ටයින් මෙනි.

*ලබන කලාපයට*

රෝහිත මුණසිංහ
*ප්‍රංශයේ සිට*